# අනුරාධපුර, පොළොන්නරුව, මහනුවර රාජධානි අවධීන් වල බුද්ධ ප්‍රතිමා නෙළීමේ තාක්ෂණික පැතිකඩ පිළිබඳ අධ්‍යයනක්

**ප්‍රේමරත්න ජී.ඩී.වී.**[1]

පුරාතන මානව කෘති අතර බුද්ධ ප්‍රතිමාවට හිමි වන්නේ වැදගත් තැනකි. මෙලෙස බුදූ පිළිම නිපදවීමේදී විවිධ යුග වල බුද්ධ ප්‍රතිමා නෙළා ඇති තාක්ෂණය කුමක්ද, ඒවා එකම තාක්ෂණයකට එකම ක්‍රමයකට නිපදවා ඇතිද යන්න සොයා බැලීම ඉතා වැදගත් වේ. මෙහිදී ලංකාව තුළ ව්‍යාප්තව ඇති බුද්ධ ප්‍රතිමා නිරීක්ෂණය කිරීමේදී ඒවා ලංකාවේ පැවති ඇතැම් යුගයන්ට ආවේණික ලෙස නිර්මානය කර ඇති බව පෙන්වා දිය හැකිය. ඒ අනුව ප්‍රධාන වශයෙන්ම ලංකාවේ පැරණි රාජධානි තුනක් වූ අනුරාධපුර, පොළොන්නරුව, මහනුවර රාජධානි වල බුද්ධ ප්‍රතිමා නෙළීමේ තාක්ෂණය පිළිබඳව කරුණු අධ්‍යයනයක් සිදු කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ පර්යේෂණ ගැටළුව වශයෙන් ගෙන ඇත. මෙම යුග තුන සඳහා එක් යුගයකට අයත් බුද්ධ ප්‍රතිමා හෝ විහාර දෙකක් පමණ යොදා ගෙන ඇත. ඒ අනුව බුද්ධ ප්‍රතිමාව නිර්මාණය කීරීම සඳහ යොදා ගත් මාධ්‍යන්, බුද්ධ ප්‍රතිමාවේ ලක්ෂණයන්, ව්‍යුහය අනුව පර්යේෂණය සිදු වේ. මේ අනුව යමින් ලංකාවේ ඉහත සඳහන් කල යුග වල බුද්ධ ප්‍රතිමා නිරීක්ෂණයේදී යොදාගත් තාක්ෂනයේ එකිනෙකට විශාල වෙනසක් ඇති බවට හඳුනාගන්නා ලදී. ඒ අනුව අනුරාධපුර සම්ප්‍රදායේ බුද්ධ ප්‍රතිමා නිර්ක්ෂණයේදී ප්‍රතිමා නෙළීමට බහුලව යොදාගෙන ඇත්තේ පාෂාණ වේ. නෙළීමට ග්‍රැනයිට් පාෂාන යොදගෙන ඇත. එම ප්‍රතිමා වල සිවුර ඇඟට ඇළුණු ස්වභාවයක් පෙන්නුම් කරනු ලබයි. රැලි රහිතයි. බුදු පිළිමය හොඳින් නිරීක්ෂනය කිරීමේදි අතීතයේ මතුපිට බදාම තට්ටුවක් තිබූ බවට සාක්ෂි හමුවේ.  එමෙන්ම පොළොන්නරුව යුගයේ බුද්ධ ප්‍රතිමා නිරීක්ෂණයේදී ඒවා ගලින් හා ගඩොල් වලින් නිර්මාණය කර ඇති බවට සාධක හමු වේ. එම බුදු පිළිම සම්පූර්න පිහිටි ගලෙහි නිර්මානය කර ඇති අතර ඒවායේ සිවුර පෙන්වීමට සමාන්තර ඉරි උපයෝගී කොටගෙන ඇත. එමෙන්ම මෙම කාල වකවානුවේ මහායාන ආභාෂය ලැබී ඇති බවට තිවංක පිළිමයෙහි යට කොටසේ ඇත් වජ්‍ර සංකේතයෙන් අනුමාන කල හැකිය. ඊට අමතරව මහනුවර යුගයේ බුද්ධ ප්‍රතිමා නිරික්ෂණයේදී වරිච්චි ක්‍රමයට බුද්ධ ප්‍රතිමා ඉදි කර ඇති බව පෙන්වා දිය හැකිය. එමෙන්ම සිවුරේ රැළි දිය රැළි ආකාරයට නිරූපනය කර ඇත. මෙහිදි ඇතැම් පිළිම විනාශ වෙමින් පවතින බවද නිරීක්ෂණය විය. මේ අනුව පැමිණිය හැකි පැහැදිලි නිගමනය වන්නෙ අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා බුදු පිළිම කලාව පැමිණිමේදී එහි තාක්ෂණික පසුබිම විශාල වශයෙන් වෙනස් වී ඇතිබවයි. එය තවත් විග්‍රහ කල හොත් බුදු පිළිම නිර්මාණයේදී කල් පැවැත්ම අතින් ගත් කල ඒවායේ ඇති ගුණාත්මක භාවය කෙමෙන් අඩු වි ඇති බවට නිගමනය කල හැකිය.

**මුඛ්‍ය පද :** තාක්ෂණික ක්‍රම, තාක්ෂණික පැතිකඩ, මාධ්‍ය, අනුරාධපුර යුගය, පොළොන්නරු යුගය, මහනුවර යුගය

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
wishwa98.dulmini@gmail.com